# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **2006 ජූලි මස 14** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 ජූලි මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 13.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 7.50 යි.**

## 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2006 ජූලි මස 14 වන දින]

එල්. ඩී.— ඕ. 37/2003.

**පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පරීක්ෂා කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; ඒ ආයතනවල වර්ධනය වැඩිදියුණු කිරීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

මහජනතාවට ආරක්ෂිත සහ කාර්යක්ෂම වෛද්‍ය සේවාවක් සැපයීම සම්බන්ධයෙන් පෞද්ගලික වෛද්‍ය ආයතන මාර්ගයෙන් වෛද්‍ය සේවාවන් සැපයීමට අදාළව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ එකී පරමාර්ථ ඉෂ්ට කර ගැනීම පිණිස ඒ සේවාවන් සැපයිය යුතු ආකාරය හඳුනාගැනීම රජයේ අවශ්‍යතාවක් බවට පත්ව ඇති හෙයින් : පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය.

**2.** (1) මේ පනතේ 4 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව තත් කාර්ය සඳහා නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයකින් දෙන ලද බලය යටතේ හැර, කිසිදු තැනැත්තකු විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් — පෞද්ගලික වෛද්‍ය ආයතන සහ ඒවා පවත්වාගෙන යන තැනැත්තන් ලියාපදිංචි කළ යුතු බව.

(අ) නිශ්චිතව සඳහන් කරන ලද පරිශ්‍ර කිසිවක් මත පිහිටුවීම හෝ පවත්වාගෙන යාම ; හෝ

(ආ) පවත්වාගෙන යාම හෝ එසේ පවත්වාගෙන යාමට වෙනත් යම් තැනැත්තකුට අවසර දීම,

නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

**3.** (1) ලියාපදිංචි කිරීමේ සහතිකයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම නියමිත ආකෘති පත්‍රයකින් අදාළ පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා මාර්ගයෙන් පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය නියමිත ගාස්තු සහ අදාළ වෙනත් සියලු ලේඛනවලින් සමන්විත විය යුතු ය. ලියාපදිංචි කිරීමක් සඳහා වූ ඉල්ලීම.

2-P L 000979 - 4,500 (2006/02)

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබුන පසුව, අදාළ ඉල්ලීමට සම්බන්ධ පෞද්ගලික වෛද්‍ය ආයතන සහ පරිශ්‍ර නියම කරනු ලැබිය හැකි නිර්නායකයන් සෑහීමකට පත් කරනු ලබන අවස්ථාවක දී පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව විසින්, ඒ ආයතනය හෝ පරිශ්‍ර ලියාපදිංචි කිරීම පිළිබඳ සභාවේ කිසිදු විරෝධතාවක් නොමැති බවට අදාළ පළාතේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට දැනුම් දෙනු ලැබිය යුතු අතර —

(අ) ඒ පෞද්ගලික වෛද්‍ය ආයතනය සහ එහි පරිශ්‍රය පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි කිරීමට සහ ඒ ආයතනය පවත්වා ගෙන යාමට ලියාපදිංචි වූ තැනැත්තා ලෙස ඒ ඉල්ලුම්කරු ලියාපදිංචි කිරීමට ; සහ

(ආ) ඉල්ලුම්කරු වෙත නියමිත ආකාරයෙන් වූ ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කළ යුතු බවට,

අදාළ පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට විධාන කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ප්‍රදානය කරන ලියාපදිංචි කිරීමේ සහතිකයක් එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයකට වලංගු විය යුතු ය.

(4) ලියාපදිංචි කිරීමේ සහතිකයක්, ඒ ලියාපදිංචිය ඉකුත් වන දිනට මසකට පෙරාතුව සහ නියමිත අලුත් කිරීමේ ගාස්තු ගෙවීමෙන් පසු, (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත අලුත් කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ එක් එක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් එකතු කර ගනු ලබන ගාස්තුවලින් සියයට පනහක් අදාළ පළාත් සභාව වෙත යවනු ලැබිය යුතු ය.

(6) පළාතේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින්, ස්වකීය කාර්යයන් කරගෙන යාමේ දී, පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමට අදාළව මේ පනත යටතේ නියම කරනු ලැබූ යම් නියමු උපදේශනවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ බලපෑම.

4. (1) 2 වන වගන්තිය යටතේ නියම කර ඇති ආකාරයට ලියාපදිංචි කරනු නොලැබ, යම් පරිශ්‍රයක යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයක් යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන හෝ පවත්වා ගෙන යනු ලබන අවස්ථාවක, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා

විසින්, ඒ කරුණ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවට දැනුම් දෙනු ලැබිය යුතු අතර, සභාව විසින් ඒ ආයතනය වෙත විධානයක් නිකුත් කරමින්, ඒ විධානයේ නියම කර ඇති කාලසීමාව තුළ දී වහාම ඒ ආයතනය නියාමන සභාව වෙත ලියාපදිංචි කරන මෙන්, ඒ ආයතනයට විධාන කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව විසින් නිකුත් කරන ලද විධානයට අනුකූලව ක්‍රියා නොකිරීම මේ පනත යටතේ වරදක් වන්නේ ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු හෝ ආයතනයක් එසේ වරදකරු කරන ලද දිනයෙන් පසු එක් මාසයක කාල සීමාවකට පසුව ද ඒ වරද දිගටම කරගෙන යන අවස්ථාවක, එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තා හෝ ආයතනය (1) වන උපවගන්තිය යටතේ නියාමන සභාව විසින් කරන ලද විධානයට අනුකූලව ක්‍රියා කරන තෙක් ඒ පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන ඒ පෞද්ගලික වෛද්‍ය ආයතනය, වසා දැමීමේ ආඥාවක්, කරන මෙන් නියාමන සභාව විසින් කරනු ලබන ඉල්ලීමක් මත, මහෙස්ත්‍රාත් අධිකරණය විසින් එසේ වසා දැමීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

පවතින පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම.

**5**. (1) නියමිත දින දී යම් පරිශ්‍රයක පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ක්‍රියාත්මක කරන හෝ පවත්වාගෙන යන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් නියමිත දින සිට මාස තුනක් ඇතුළත තමා සහ අදාළ පරිශ්‍රය පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය යම් පියවර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන බලාත්මක කිරීමේ දී මේ පනතේ 2 වන වගන්තියේ, 3 වන වගන්තියේ සහ 4 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එයට හෝ එය සම්බන්ධයෙන් අදාළ කරගත යුතු ය.

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව.

**6**. (1) මේ පනතේ කාර්ය සඳහා පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවක් (මේ පනතේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පිහිටුවනු ලැබිය යුතු අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන් —

(i) පහත සඳහන් එක් එක් සංගම් නියෝජනය කිරීම සඳහා ඒ එක් එක් සංගම් විසින් නම් කරනු ලබන එම සංගම්වලින් එක් නියෝජිතයෙක් බැගින් ද :—

(අ) නිදහස් වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමය;

(ආ) ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමය; සහ

(ඇ) වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමය;

(ii) ගණකාධිකරණය, කළමනාකරණය, නීති සහ භෛදි යන ක්ෂේත්‍රවල විශිෂ්ට සේවයක් කර ඇති ඒ ඒ ක්ෂේත්‍ර වලින් එක් අයකු බැගින් ;

(iii) පෞද්ගලික ආරෝග්‍යශාලා සහ සාත්තු නිවාස සංගමයේ නියෝජිතයන් නව දෙනෙක් ; සහ

(ආ) පහත සඳහන් නිලබලයෙන් පත් වන සාමාජිකයන් :—

(i) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ii) පෞද්ගලික වෛද්‍ය අංශ සංවර්ධනය භාර අධ්‍යක්ෂවරයා;

(iii) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ රෙජිස්ට්‍රාර්වරයා ; සහ

(iv) එක් එක් පළාතේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා.

(2) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සභාවේ සභාපතිවරයා විය යුතු අතර, පෞද්ගලික වෛද්‍ය අංශ සංවර්ධන අධ්‍යක්ෂවරයා එහි ලේකම්වරයා විය යුතු ය.

(3) සභාවේ පත් කළ සාමාජිකයකු, මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය අත්හළහොත් හැර වසර තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(4) පත් කළ සාමාජිකයකු, පිළිගත හැකි හේතුවක් ලෙස සභාව විසින් සලකන යම් හේතුවක් නොමැතිව සභාවේ රැස්වීම් තුනකට පිට පිටම නොපැමිණියහොත්, එම සාමාජිකයා ධුරය අත්හැර ගිය අයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (අ) සභාවේ යම් රැස්වීමක ගණපූරණය, සාමාජිකයන් හත් දෙනකු විය යුතු ය;

(ආ) සභාපතිවරයා සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර, සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයන් විසින් මුලසුන දැරීම සඳහා සාමාජිකයකු තමන් අතරින් තෝරා පත්කර ගත යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් ඕනෑම අවස්ථාවක සභාවේ පත් කළ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) සභාවේ යම් පත් කළ සාමාජිකයකු විසින්, තමා ධුරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) පත් කළ සාමාජිකයකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන්, ධුරය හිස් කරන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන, ඒ සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයකු වශයෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. එම සාමාජිකයා වෙනුවෙන් පත් කරනු ලැබූ යම් අනුප්‍රාප්තිකයකු විසින් තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සභාව සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු බව.

7. (1) සභාව, 6 වන වගන්තිය යටතේ එයට පවරන ලද නාමයෙන් සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

සභාවේ මුද්‍රාව.

8. (1) සභාවේ මුද්‍රාව සභාවේ ලේකම්වරයාගේ භාරයේ හෝ සභාව විසින් බලය දෙනු ලබන වෙනත් යම් සාමාජිකයකුගේ භාරයේ හෝ තිබිය යුතු ය.

(2) සභාවේ මුද්‍රාව සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ සභාපතිවරයා සහ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සභාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා ම එම සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය :

එසේ වුව ද යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට සභාවේ මුද්‍රාව තබන විට සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකිවන අවස්ථාවක දී සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා ලිඛිතව බලය පවරනු ලබන වෙනත් යම් සාමාජිකයකුට මේ උපවගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට අනුකූලව එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීමට බලය ඇත්තේ ය.

(4) සභාවේ මුද්‍රාව තබනු ලබන්නේ යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට ද එම සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳ නාම ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

සභාවේ අරමුණු.

**9**. මේ පනත යටතේ සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉතා සුදුසු යයි සභාව සලකන යම් ආකාරයකින් සභාව විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටුකිරීම කළ යුතු ය :—

(අ) ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වාගෙන යා යුතු ප්‍රමිති සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම ;

(ආ) ඒ පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන ප්‍රමිති ඇගයීමේ ක්‍රමය ;

(ඇ) සියලු පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සේවක පිරිස් බඳවා ගැනීම්වල දී අවම සුදුසුකම් අනුගමනය කරන බවට ද, සේවක පිරිස් පුහුණු කිරීමේ දී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට ද වගබලා ගැනීම;

(ඈ) ඒ පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පිරිනමනු ලබන හෝ සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මක භාවය තහවුරු කිරීම.

සභාවේ කාර්ය සහ කර්තව්‍ය.

**10**. සභාව විසින් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්ය කිරීම ද, කර්තව්‍ය ඉටු කිරීම ද සිදු කළ යුතු ය:—

(අ) පෞද්ගලික වෛද්‍ය ආයතනවල රෝගීන් රැකබලා ගැනීම සඳහා ගුණාත්මක භාවය සහතික කිරීමේ වැඩ සටහන් ක්‍රමවත්ව සකස් කිරීම සහ ඒවා අධීක්ෂණය කිරීම;

(ආ) ඒ පෞද්ගලික වෛද්‍ය ආයතනවල සේවයෙහි නියුක්ත කර ඇති හෝ යොදාගෙන ඇති සියලු කාර්ය මණ්ඩලවල බඳවා ගැනීම් සඳහා අවම ප්‍රමිතීන් පවත්වා ගෙන යාම;

(ඇ) අදාළ සෞඛ්‍ය තොරතුරු හා සංඛ්‍යා ලේඛන එකතු කිරීම හා ප්‍රකාශයට පත් කිරීම;

(ඈ) ඒ ඒ පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සලසනු ලබන පහසුකම්වලට අනුව ඒවා වර්ග කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම; සහ

(ඉ) 9 වන වගන්තියේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් කර්තව්‍ය.

**11**. සභාව විසින් අවශය යයි සලකනු ලබන අවස්ථාවල දී මේ පනත යටතේ සභාවේ කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම, සභාවේ යම් සාමාජිකයකුට හෝ සාමාජිකයන්ට හෝ සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත වන කමිටුවක් වෙත හෝ පවරනු ලැබිය හැකි අතර, එසේ පවරනු ලැබූ සාමාජිකයා, සාමාජිකයන් හෝ කමිටුව විසින් සභාවේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව ඒ කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම කළ යුතු ය. සභාව විසින් සිය කාර්ය සහ කර්තව්‍ය පැවරිය හැකි බව.

**12**. (1) සභාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. සභාවේ අරමුදල.

(2) සභාවේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) සභාව විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී ගාස්තු, අනු ප්‍රමාණ, අයකිරීම් වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ සභාවට ලැබිය හැකි සියලු මුදල් ;

(ඇ) ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් සභාවට ලබාදෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද සභාව විසින් දරනු ලබන සියලු මුදල් පියවීම සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පෞද්ගලික වෛද්‍ය ආයතන ප්‍රතීතණය කිරීම.

**13**. (1) සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතණය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාවේ යොදනු ලැබිය යුතු ය. ප්‍රතීතණය සඳහා වූ නිර්ණායක, සංයුක්ත වන පහසුකම්, සේවා සහ වෙනත් යම් සාධක නිශ්චිතව දැක්වෙන සියලු විස්තර ඒ නියමයෙහි ඇතුළත් විය යුතු ය :

එසේ වුව ද ප්‍රතීතණය කිරීමේ එවැනි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට පෙර හෝ එයට තදනන්තරව කරනු ලබන වෙනස් කිරීම් සිදු කිරීමට පෙර, අදාළ සම්බන්ධතා ඇති තැනැත්තන් වෙත මාස නවයක කාලයක් ලබා දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමෙහි කුමක් සඳහන් වුව ද, ප්‍රතීතණය පිළිබඳ සභාවේ අවසාන තීරණය යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට දැනුම් දෙන තුරු, ඒ ආයතනය විසින් ස්වකීය සේවා දිගටම සැලසිය යුතු ය :

එසේ වුව ද, යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ප්‍රතීතණය සඳහා සුදුසුකම් නොලබන අවස්ථාවක දී, ප්‍රතීතණය සඳහා සුදුසුකම් ලැබීමට සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතීන් අත්කර ගැනීම සඳහා ඒ ආයතනය වෙත ලිඛිතව ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතු ය.

(3) ප්‍රතීතණය කිරීම පිළිබඳ යෝජනා ක්‍රමවල විස්තර කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා සභාවට සහාය වීම හා උපදෙස් දීම පිණිස හා එම යෝජනා ක්‍රම ප්‍රකාරව ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කිරීම හා අගැයීම පිණිස උපකාරීවීම සඳහා අවශ්‍ය දැනුම, විශේෂඥතාව, නිපුණත්වය හෝ උගත්කම ඇති බව සභාවේ මතය වන තැනැත්තන්ගෙන් සැදුම්ලත් මූල මණ්ඩලයක්, සභාව විසින් අවශ්‍ය අවස්ථාවල දී කැඳවනු ලැබිය යුතු ය.

(4) ප්‍රතීතණය කිරීම පිළිබඳ යෝජනා ක්‍රමය පියවරෙන් පියවර හෝ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් ආකාරයකට, හෝ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ පෞද්ගලික වෛද්‍ය ආයතනයක ප්‍රතීතණයකින් ඒ ආයතනය විසින් ජීවිතයක් බේරා ගැනීමේ හදිසි අවස්ථාවක දී කටයුතු කරනු ලැබීම සීමා නොවිය යුතු ය.

ඇතුල්වීමට සහ පරීක්ෂා කිරීමට බලය.

**14**. (1) යම් බලයලත් නිලධරයකු විසින් කලින් දැනුම් දීමකින් තොරව, දහවල් හෝ රාත්‍රියේ යම් වේලාවක දී යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ ඊට අදාළ යම් පරිශ්‍රයකට ඇතුළුවීම හා මේ පනතේ කාර්ය සඳහා යම් පරීක්ෂා කිරීමක්, විභාග කිරීමක්, විමර්ශනයක් හෝ සමීක්ෂණයක් පවත්වාගෙන යාමේ කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි සියලු ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) අධිකරණයේ අවසර අවශ්‍ය යම් රහසිගත තොරතුරු හැර යම් ලේඛන හෝ වාර්තා පරීක්ෂා කිරීමට සභාව විසින් විශේෂයෙන් බලය පවරා ඇත්නම් මිස, යම් ආයතනයක සිටින රෝගියකුට අදාළ වෛද්‍ය වාර්තාවක් පරීක්ෂා කිරීමට යම් තැනැත්තකුට බලය පවරන ලෙස මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවල සඳහන් වූ කිසිවකින් සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් තේරුම් නොගත යුතු ය.

(3) යම් බලයලත් නිලධරයකුට, මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන මගින් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, විරෝධය පාන හෝ බාධා කරන සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා “බලයලත් නිලධරයා” යන්නෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් සභාවේ නිර්දේශ මත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අදාළ පළාත් සභාවේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හෝ වෙනත් යම් නිලධරයෙක් හෝ අදහස් වේ.

වැරදි.

**15**. (1) යම් ලියාපදිංචි කරන ලද තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් —

(අ) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන යම් නියෝගයක් හෝ රීතියක් නැතහොත් නීත්‍යානුකූලව දෙන ලද යම් නියමයක් හෝ විධානයක් කඩ කළහොත් හෝ ඊට එකඟව ක්‍රියා කිරීම පැහැර හැරියහොත් ;

(ආ) මේ පනත යටතේ නිකුත් කරන ලද යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක අන්තර්ගත යම් කොන්දේසියක් හෝ විධිවිධානයක් කඩ කළහොත් හෝ ඊට එකඟව ක්‍රියා කිරීම පැහැර හැරියහොත්,

ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) යම් තැනැත්තකු —

(අ) මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමට තැත්කළහොත් ; හෝ

(ආ) මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමට වෙනත් තැනැත්තකුට ආධාර හෝ අනුබල දුනහොත්,

ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(3) සභාවේ ලිඛිත අනුමතය ඇතිව හැර, (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් නොකළ යුතු ය.

දණ්ඩන.

**16**. (1) මේ පනත යටතේ වරදකට මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී —

(අ) එම වරද නිසා මනුෂ්‍ය ජීවිතයට අනතුරක් සිදුවීම හෝ මහජන සෞඛ්‍ය හෝ මහජන ආරක්ෂාව බැරෑරුම් ලෙස උපද්‍රවයට පත්වන අවස්ථාවක, ඒ තැනැත්තා රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය;

(ආ) වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන විට —

(i) වරද පළමු වරට සිදු කරන අවස්ථාවක දී, ඒ තැනැත්තා රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට ;

(ii) වරද දෙවන වරට හෝ ඊට පසු අවස්ථාවක සිදු කළ විට, ඒ තැනැත්තා රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට ; සහ

(iii) වරද දිගටම සිදු කරන අවස්ථාවක දී, වරදකරු කරනු ලැබීමෙන් පසු වරද දිගටම සිදු කරනු ලබන එක් එක් දිනය වෙනුවෙන් එක් දිනකට රුපියල් දහසක් නොඉක්මවන තවදුරටත් වූ දඩ මුදලකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක්

ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා,

යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තකු, එවැනිම හෝ ඊට සමාන ස්වභාවයේ දෙවන වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා දෙවන වරද සඳහා වරදකරු කරනු ලබන මහෙස්ත්‍රාත් අධිකරණය විසින්, මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ ඒ තැනැත්තා වෙත ප්‍රදානය කර ඇති හෝ නිකුත් කර ඇති යම් සහතිකයක්, බලය පැවරීමක් හෝ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබිය යුතු අතර, ඒ අවලංගු කිරීම පිළිබඳව සභාව වෙත දැනුම් දෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

**17**. මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයා, සාමාන්‍යාධිකාරිවරයා, ලේකම්වරයා හෝ වෙනත් සමාන විධායක නිලධරයකු වූ සෑම තැනැත්තකු ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩල සංස්ථාවක් නොවන්නේ නම්, වරද සිදු කරන ලද අවස්ථාවේ දී, ඒ මණ්ඩලයේ සභාපතිවරයා, සාමාන්‍යාධිකාරිවරයා ලේකම්වරයා හෝ වෙනත් සමාන විධායක නිලධරයකු වූ සෑම තැනැත්තකුම,

ඒ වරද සිදු කරන ලද්දේ තම දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්‍යෝගයක්ම යොදා ක්‍රියා කළ බව ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ තැනැත්තා ඒ වරදට වරදකරු වන්නේ යයි සලකනු ලැබිය යුතු ය.

නියෝග.

**18**. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතල වලට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් සභාවේ උපදෙස් මත, පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ දී හා එම ලියාපදිංචිය අලුත් කිරීමේ දී, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයන් විසින් අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු නියමු උපදේශන ;

(ආ) පනත ප්‍රකාරව පිරිනමන ලද හෝ ඉටුකරන ලද යම් සේවා සඳහා නැවත අය කරගත යුතු හෝ ලැබිය යුතු අනුප්‍රමාණ, අය කිරීම් හෝ වෙනත් වියදම් ;

(ඇ) ලියාපදංචි කරන ලද පෞද්ගලික වෛද්‍ය ආයතනවල සියලු ගොඩනැගිලි හා පරිශ්‍රවල ඉදිකිරීම් සැලසුම් කිරීම, ආලෝකය සැපයීම, අලුතින් කොටස් එකතු කිරීම, වැඩිදියුණු කිරීම සහ පවිත්‍රතාවය පවත්වාගෙන යාම ;

(ඈ) බෝවන රෝග වැළඳී ඇති රෝගීන් ප්‍රතිකාර සඳහා ඇතුළත් කර ගතහැකි අවස්ථා හා එවැනි අවස්ථාවල දී ගතයුතු ආරක්ෂක ක්‍රියාමාර්ග ;

(ඉ) බෝවන රෝග වැළැක්වීම හා පාලනය කිරීම සඳහා ලොව පුරා පිළිගත් ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිපැදීම ;

(ඊ) පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සලසනු ලබන සේවා මත හෝ ඉටු කරනු ලබන කර්තව්‍ය මත එම ආයතන කාණ්ඩවලට වර්ගීකරණය කිරීම ;

(උ) සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තකුට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන යම් පැමිණිල්ලක් භාර ගැනීමේ දී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ පරිචය ;

(ඌ) පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සපයන ලද නැවතීමේ ගාස්තු, ඖෂධ හා සේවා සඳහා අය කිරීම් ; සහ

(එ) මේ පනත යටතේ පවරන ලද නඩු මෙහෙයවීම සඳහා සුදුසුකම් ලත් නිලධරයන් පත් කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ සඳහන් කරනු ලබන යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**19**. (1) පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය :— රීති .

(අ) පෞද්ගලික වෛද්‍ය ආයතනය විසින් වාර්තා, පොත්, ලේඛන, බිල්පත්, ලදුපත්, වාර වාර්තා, ප්‍රකාශ, ආකෘති පත්‍ර සහ වෙනත් ලේඛන පවත්වා ගෙන යාම ;

(ආ) පෞද්ගලික වෛද්‍ය ආයතනයක් විසින් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය වෙත කලින් කල ඉදිරිපත් කිරීමට නියමිත වාර්තා, වාර වාර්තා, ප්‍රකාශ සහ වෙනත් තොරතුරු ;

(ඇ) වාට්ටුවල හෝ කාමරවල අවම විශාලත්වය සහ එක් එක් රෝගියා සඳහා වෙන් කළ යුතු අවම ඉඩ ප්‍රමාණය ;

(ඈ) නේවාසික රෝගීන් සහ ඒ පෞද්ගලික වෛද්‍ය ආයතනවල සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සහ ස්නානය කිරීමේ පහසුකම් සැලසීම ;

(ඉ) යන්ත්‍රෝපකරණ, උපකරණ, උපායන, මෙවලම්, ආම්පන්න පිහන් භාණ්ඩ, සවිකිරීම්, ගෘහ භාණ්ඩ සහ සාමාන්‍ය හා විශේෂ ස්වභාවයේ වෙනත් අවශ්‍ය භාණ්ඩ ;

(ඊ) යම් නිශ්චිත රෝග වැළැක්වීම සඳහා පෞද්ගලික වෛද්‍ය ආයතනවල සේවයේ නියුක්ත තැනැත්තන් ප්‍රතිශක්තිකරණය කිරීම ;

(උ) මාතෘ නිවාසයකට හෝ ගර්භණී රෝගීන් භාර ගැනීමට සහ ඔවුන්ට ප්‍රතිකාර කිරීමට වෙන් වෙන් හා තනිකර පහසුකම් ඇති වෙනත් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හැර, ගර්භණී රෝගීන් ඇතුළත් කිරීම තහනම් කිරීම හෝ සීමා කිරීම ;

(ඟ) ගර්භණී රෝගීන් නොවන වෙනත් රෝගීන්, මාතෘ නිවාසයකට හෝ ගර්භණී රෝගීන් භාර ගැනීමට සහ ඔවුන්ට ප්‍රතිකාර කිරීමට වෙන් වෙන් හා තනිකර පහසුකම් ඇති වෙනත් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට, ඇතුළත් කිරීම තහනම් කිරීම හෝ සීමා කිරීම ;

(එ) සේවක පිරිස් බඳවා ගැනීමේ ක්‍රමය හා ඔවුන්ගේ අවම සුදුසුකම් ඇතුළුව කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ආකාරය තීරණය කිරීම, ඒ සේවක පිරිස්වල පදවි ප්‍රාප්තිය සහ ඒ සේවක මණ්ඩල විසින් අනුගමනය කළ යුතු සේවාස්ථ පුහුණු හා සංස්කරණ පාඨමාලා ;

(ඒ) ප්‍රතිකාර කිරීමේ විශේෂ ක්ෂේත්‍රයන්හි ලා පවත්වා ගෙන යා යුතු විශේෂඥ අංශ හා අනුයාත සේවා පිළිබඳ අර්ථ නිරූපණය කිරීම ;

(ඔ) කැලි කසළ සහ අපද්‍රව්‍ය බැහැර කිරීම ;

(ඕ) රෝගීන් සහ ආයතනයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ අනුපාතය අනුව වාට්ටුවලට, මුළුතැන් ගෙවල්වලට, නානකාමර හා වැසිකිළිවලට සින්ක්, කරාම සහ අපවිත්‍ර ජලය පිට කිරීමේ ක්‍රම සැපයීම ;

(ක) රෝගීන්ගේ සෞඛ්‍ය තත්වය මනාව පවත්වා ගැනීම සඳහා අවශ්‍යවන නිවාස, නේවාසික නිල නිවාස සහ ගමනාගමන පහසුකම් සැලසීම ;

(ග) සියලු ආයතනික වත්කම්, යන්ත්‍රෝපකරණ සහ උපකරණ පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් ප්‍රවීනයන් ලබා දීම.

(2) සභාව විසින් සාදන ලද කිසිදු රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවන්නේ ය.

අර්ථ නිරූපණය.

**20**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ප්‍රතීතණය" යන්නෙන්, පෞද්ගලික වෛද්‍ය ආයතනවල තාක්ෂණික ප්‍රවීණතාව සහ සේවාවන්හි ගුණාත්මකතාවය සහ පහසුකම් සහතික කිරීමේ කාර්ය සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය අදහස් වේ ; සහ

"පෞද්ගලික වෛද්‍ය ආයතනය" යන්නෙන්, යම් රෝගයකින්, තුවාලයකින් හෝ අබලතාවකින් පෙළෙන තැනැත්තන් භාර ගැනීම සහ ඒ තැනැත්තාට වෛද්‍ය හා සාත්තු සේවා සහ වෛද්‍ය ප්‍රතිකාර සැලසීම සඳහා භාවිතා කරනු ලබන හෝ භාවිත කිරීමට අදහස් කරනු ලබන යම් ආයතනයක් හෝ ස්ථානයක් ද, ආරෝග්‍යශාලාවක්, සාත්තු නිවාසයක්, මාතෘ නිවාසයක්, වෛද්‍ය රසායනාගාරයක්, ලේ බැංකුවක්, දන්ත ශල්‍යාගාරයක්, බෙහෙත් ශාලාවක් හා ශල්‍යාගාරයක්, රෝගීන් බලන ස්ථානයක් සහ සෞඛ්‍ය පරීක්ෂණ සේවා හෝ සෞඛ්‍ය ප්‍රවර්ධන සේවා සලසන ආයතනයක් ද අදහස් වන නමුත්, රජය මගින් පවත්වා ගෙන යනු ලබන හෝ පාලනය කරනු ලබන නිරීක්ෂණ නිවාසයක්, මානසික රෝහලක්, ආරෝග්‍යශාලාවක්, සාත්තු නිවාසයක්, බෙහෙත් ශාලාවක්, වෛද්‍ය මධ්‍යස්ථානයක් හෝ වෙනත් යම් ස්ථානයක් ද යම් ඖෂධයක්, පිළියෙල කරන ලද බෙහෙත් සංයෝගයක් හෝ ඖෂධ නිෂ්පාදනයක් කලවම් කිරීම හා විකිණීම සඳහා තනිකරම භාවිත කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් පෞද්ලික බෙහෙත් ශාලාවක් හෝ ෆාමසියක් හෝ ඖෂධ ශාලාවක් හෝ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ සහ 1970 අංක 7 දරන හෝමියෝපති පනතේ විධිවිධාන යටතේ වූ යම් කාර්යයක් සඳහා ලියාපදිංචි කරන ලද යම් ආයතනයක් හෝ පරිශ්‍රයක් හෝ එයට ඇතුළත් නොවේ.

**21**. (1) (220 වන අධිකාරය වූ) සාත්තු නිවාස (පාලන) පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීම.

(2) සාත්තු නිවාස (පාලන) පනත ඉවත් කිරීම නොතකා ඒ යටතේ ලියාපදිංචි කරන ලද යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයක ලියාපදිංචිය වලංගු හා බල සහිත ලෙස සලකනු ලැබිය යුතු අතර, නියමිත දිනයේ සිට මාස තුනක කාලයක් සඳහා එසේ වලංගුව හා බල සහිතව පවත්නේ යයි සලකනු ලැබිය යුතු ය. තවද ඒ කාලය ඇතුළත ඒ වෛද්‍ය ආයතනය විසින් මේ පනතේ විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි කරනු ලැබීම සඳහා අයදුම් කළයුතු බවට නියමිත වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඒ උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි එහි සඳහන් කාලය තුළ මේ පනත යටතේ ලියාපදිංචිය ලබා ගැනීමට අපොහොසත් වන අවස්ථාවක, ඉවත් කරනු ලැබූ පනත යටතේ ලබා ගත් ලියාපදිංචිය එසේ සඳහන් කාලය ඉකුත් වීමේ දී හා ඉකුත් වීමෙන් පසුව, වලංගුව බලපැවැත්වීම අවසන් විය යුතු ය.

**22**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.